# අඹ වගාව

පළතුරක් ලෙස අඹ ගෙඩි කෑමට ගන්නා අතර ටින් කරන ලද පළතුරු, ජෑම්, සිරප්, සහ බීමක් වශයෙන් ද වියළි අඹ වශයෙන්ද ප්‍රයෝජනවත්වේ.

**වර්ග:**

ජනප්‍රිය අඹ වර්ග රාශියක්ම ශ්‍රී ලංකාවේ තිබීම අපේ රටට මහත් වාසියකි. පහත සඳහන් වර්ග නිර්දේශිත ඒවාය.

**වියළි කලාපය සඳහා:**

කර්තකොලොම්බන්, වෙල්ලෙයි කොලොම්බන්, අඹලාවි, වෙම්බාටන් සහ විලාඩ්.

**අන්තර් කලාපය සඳහා:**

කර්තකොලොම්බන්, වෙල්ලෙයි, කොලොම්බන්, විලාඩ් සහ බෙට්ටි අඹ.

**තෙත් කලාපය සඳහා:**

වෙල්ලෙයි කොලොම්බන්, ගිරාඅඹ, පිටර් පසාන්ඩ් සහ දම්පර අඹ.

අන්තර් කලාපයේ සහ තෙත් කලාපයේ බෙට්ටි අඹ හොඳ අස්වැන්නක් ලබාදෙන නමුත් එය එතරම් හොඳ වර්ගයක් ලෙස හැඳින්විය නොහැක.

**පස:**

තද මැටි සහිත, දිය සිරාව පවතින ස්ථාන අඹ සඳහා සුදුසු නැත.

**පරතරය:**

කර්තකොලොම්බන් හා වෙල්ලෙයි කොලොම්බන් වැනි විශාල ගස් වර්ග සඳහා මීටර් 10 – 11 ක් ද විලාඩ් වැනි කුඩා ගස් වර්ග සඳහා මීටර් 7–8 ක පරතරයක් ද දිය යුතුය.

**සිටුවීම:**

පැල බෝකිරීම වැඩි වශයෙන් කෙරෙන්නේ බද්ධ කිරීමෙනි. බද්ධ කරන ලද පැල පොලිතින් බඳුනෙන් ඉවත් කර බද්ධ අංකුරය පසෙන් උඩට සිටිනසේ ප්‍රවේසමෙන් සිටුවිය යුතුය. සිටුවීමෙන් පසුව ද ග්‍රාහක කඳෙන් මතු වන අංකුර ඉවත් කිරීම ඉතා වැදගත්වේ.

**ජල සම්පාදනය:**

කල් ඇතිව වලවල් සාදා ගන්න. තද බොරළු ඇති ස්ථානවල මීටර් 1 ක් දිග, පළල හා මීටර් 7.5 ගැඹුරට ද බුරුල් පස් ඇති ස්ථානවල සෙ. මී. 60 සෙ. මී. 60 සෙ. මී. 60 ප්‍රමාණයේ වලවල් සකස්කර ගන්න. මේ වලවල් වලට ගොම පොහොර කොළ පොහොර සෑහෙන ප්‍රමාණයක් එක්කල යුතුය.

ක්ෂේත්‍රයේ සිට වූ පැලවලට මුල් අවධියේ දී ජලය සැපයීම වැදගත් ය. පසු කලක දී එම ගස්වලින් හොඳ අස්වැන්නක් ලබා ගැනීමට එය බලපානු ඇත.

අඹ ගස් ඉතා බාල වයසේ දී ම නිසි පරිදි හැඩයකට පුහුනු කළ යුතුය.

එය මතුපිට සිට මීටර් ½ පමණ ඉහළට යනතෙක් ප්‍රධාන කඳෙන් මතු වන සියළුම අතු ඉවත් කළ යුතුය. පළමු අත්ත පොළව මතුපිට සිට ප්‍රධාන කඳේ මීටර් ½ ඉහලින්ද දෙවන අත්ත පළමු අත්තට සෙමී. 15 – 30 පමණ ඉහලින් ද, පළමු අත්තට පසෙකින් විරුද්ධ අතට වර්ධනය වීමට ඉඩ දිය යුතුය.

තුන්වන අත්ත දෙවන අත්තත් පළමු අත්තත් අතර දිශාවට විහිදෙන සේ දෙවන අත්තට සෙ. මී. 15 – 30 පමණ ඉහළින් වැඩීමට ඉඩදිය යුතුය. අවශ්‍ය නම් මෙලෙස අතු 5 දක්වා වර්ධනය වීමට ඉඩ දිය හැක.

මීට අමතර ව එකිනෙක හැපී වැඩෙන, දුර්වල, මැරුනු, හානි වූ හෝ රෝගී වූ අනවශ්‍ය අතු කපා ඉවත් කළ යුතුය.

**වල් මර්ධනය;**

අඹ වගාවේ දී පූර්ණ වල් මර්ධනයක් නොකෙරේ. ගසේ පාමුල වටා වල් සම්පූර්ණයෙන් ම වර්ධනය කළ යුතු වේ. වල් මර්ධනය සඳහා රසායනික වල් නාශක භාවිතා කළ හැකිය.

උදළු ගෑමෙන් වල් ඉවත් කළ හැක. මෙහි දී ගසට හානි නොවී මට වගබලා ගත යුතුය. අඹ ගස් අතර ප්‍රදේශවල වල් කෙටි වනයේ වල් ගැසීම කළ යුතුය.

**පොහොර යෙදීම:**

| යෙදිය යුතු අවස්ථාව | තෙත් කලාපය මිශ්‍රණය | තෙත් කලාපය ගසකට යෙදිය යුතු ප්‍රමාණය (ග්‍රෑම්) | වියළි හා අන්තර් කලාප මිශ්‍රණය | වියළි හා අන්තර් කලාප ගසකට යෙදිය යුතු ප්‍රමාණය (ග්‍රෑම්) |
|---|---|---|---|---|
| සිටුවීමේදී මූලික පොහොර | 12–14–14 | 450 | 16–20–12 | 450 |
| සිටුවා අවු: 1කට පසු | –එම- | 450 | –එම– | 450 |
| සිටුවා අවු: 2කට පසු | –එම– | 675 | එම— | 675 |
| සිටුවා අවු: 3කට පසු | –එම– | 700 | –එම- | 700 |
| එලදරණ විට අවු: 4කට පසු | 11–10–25 | 700 | 12–8–34 | 700 |
| එලදරණ විට අවු: 5කට පසු | -එම– | 1350 | –එම– | 1350 |
| එලදරණ විට අවු: 6කට පසු | –එම - | 1800 | –එම - | 1800 |
| එලදරණ විට අවු: 7කට පසු | –එම- | 2250 | –එම– | 2250 |
| එලදරණ විට අවු: 8කට පසු | –එම | 2700 | –එම– | 2700 |
| එලදරණ විට අවු: 7 කට පසු | –එම- | 3150 | –එම- | 3150 |
| එලදරණ විට අවු: 10 කට පසු | –එම- | 3600 | –එම– | 3600 |

12–14–4 හා 11 –10 25 මිශ්‍රණය සඳහා යූරියා රොක්පොස්ෆේට් හා මියුරේට් ඔෆ් පොටෑස් ද 16–20–12 හා 12 –8–34 මිශ්‍රණය සඳහා යූරියා, සාන්ද්‍ර සුපර් පොස්ෆේට් සහ මියුරේට් ඔෆ් පොටෑස් ද භාවිතා කළ යුතුවේ.

(ඉතිරි කොටස ලබන කලාපයේ පළවේ.)